# හිනා මිනා

## ප්‍රශ්ණ දෙක

මංගල උත්සවයකට සහභාගී වී සිටි තලතුනා මහතෙක් වන සිරිපාල තනිවම වාඩී වී සිට කල්පනා කරනුයේ ''මම විතරක් තනිවෙලා, අර අනික් කට්ටිය ඔක්කොම එක එක්කෙනා එක්ක කතා කර කර ඉන්නවා. මමත් කවුරු හරි තනි වෙලා ඉන්න එක්කෙනෙක් හොයා ගන්න ඕනෙ එතකොට මටත් කතා කොර කොර ඉන්න පුළුවන්'' එවිටම ඔහු තනි වී සිටි කාන්තාවක් දුටුවේය. ඒත් මං ගිහිල්ල ඒ ගෑනු ළමයගෙන් මොනවද අහන්නෙ ඔහු ප්‍රශ්ණ දෙකක් සකසා ගත්තේය.  ඉස්සෙල්ලාම අහනව ඔයා බැඳලද කියල, ඊළඟට අහනව බබාල කී දෙනෙක් ඉන්නවද කියල ඊට පස්සෙ බැරියෑ හොඳට කතාවට වැටෙන්න. මෙසේ සිතා ඔහු  කාන්තාව අසල පුටුවක වාඩි වී ඇගෙන් මෙසේ ඇසුවේය.

**සිරිපාල - ඔයා බැඳලද**
**කාන්තාව - නෑ**
**සිරිපාල - ඔයාට බබාල ඉන්නවද**
**කාන්තාව - පිස්සුද ඕයි**
**කෝපයට පත් කාන්තාව එතනින් නැගිට ගියේය. ප්‍රශ්ණ දෙකේ අනු පිළිවෙලෙහි වරදක් ඇති බව සිරිපාල තේරුම් ගත් අතර ඔහු තනිව සිටි වෙනත් කාන්තාවක් අසලට ගියේය.**
**සිරිපාල - ඔයාට බබාල ඉන්නවද?**
**දෙවන කාන්තාව - ඔව්**
**සිරිපාල - ඔයා බැඳලද?**
**දෙවන කාන්තාව - තමුසෙ හිතුවද මං අවලං ගෑනියෙක් කියල බඳින් නැතුව ළමයි හදන්න.**
**කොප වූ ඇය කීවාය.**

## සම්මුඛ පරීක්ෂණය

ප්‍රේමපාල සම්මුඛ පරීක්ෂණ ස්ථානයට ගියේය. එහි ඊතල සළකුණුවලින් පැති දෙකකට යන්නට මග සලකුණු කොට තිබිණ. එක් පැත්තක් උසස් පෙළ සමත් අනෙක් පැත්ත උසස් පෙළ අසමත්. ඔහු උසස් පෙළ අසමත් හෙයින් ඒ පෙදෙසට ඇති මාවත දිගේ ගියේය. ඉන්පසු නැවතත් දෙපසට ඊතල සලකුණු දෙකකි. වෘත්තීය සුදුසුකම් ඇති, වෘත්තීය සුදුසුකම් නැති. ප්‍රේමපාලට වෘත්තීය සුදුසුකම් නැති හෙයින් ඔහු ඒ මාවත දිගේ ගියේය. ඉන් පසු නැවතත් ඊතල දෙකකි. ඉංග්‍රීසි කතා කළ හැකි, ඉංග්‍රීසි කතා කිරීමට නොහැකි. ප්‍රේමපාලට ඉංග්‍රීසි කතාව බැරි නිසා ඔහු ඒ මාවත දිගේ ගියේය. ඒ මාවතේ කෙළවර වැටුනේ මහපාරටය.

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au

## විනී හෙට්ටිගොඩ



